# <u>ඝන වනපියසක අතරමංවූ නව අත්දැකීමක්</u>

ගාල්ල ප්‍රදේශයේ හියාරේ වනපියස අක්කර 600 ක පමණවූ ස්වභාවික වනාන්තරයකි. එහි කෙළවරක පිහිටි වනජීවී සංගමයට අයත් නිල නිවස තුල තෙදිනක් ගත කළ මම තවත් හත්දෙනෙක් (කුලසේකර-4S7KG, සිරිමාන්න-4S7DSB, මහින්ද අබේවර්ධන-4S7PA, සිරිමෙවන් අබේසිංහ-4S7SA, ජර්මන් ජාතික පීටර්-DC0KK/4S7KKG, කිංස්ලි විමලවංශ සහ මග පෙන්වන්නා) සමග 2016 දෙසැම්බර් 12 වැනිදා දහවල් 11 ට පමණ ඝන වනය තුලට පිවිසියෙමි. අප සියල්ලෝම හියාරේ වැව අසල ඇති අඩිපාර දිගේ කිලෝමීටරයක් පමණ ගමන්කරන අතරතුර එහිවූ කන්ද නැගීමට මා යෝජනා කළත් කිසිවෙකුගෙක් ඊට ධනාත්මක ප්‍රතිචාරයක් නොලැබින.










එබැවින් ටිකදුරක් ඉහළට නැගීමට මම අදහස් කළෙමි. ජලාශය පෙනි පෙනී තනිවම වනය තුලට පිවිසුන අතර හදිසියේම රුස්ස ගසක අමු අත්තක් මට අඩි කීපයක් ඉදිරියේ කඩා වැටුනෙන් මා තිගැස්සුනි. මා සිතුවේ වඳුරන් හෝ රිලවුන් ඇති බවයි. නමුත් උඩ බැලූ මට කිසිම සතෙක් සිටින බවක් දක්නට නොලැබුනි. සුළඟක්ද ඇත්තේම නැත. වටපිට බලනවිට දුරින් පෙනුන ජලාශයද පෙනෙන තෙක් මානයේ නොවීය. එහා මෙහා ඇවිද බැලුවත් ජලාශය පිළිබඳ කිසිම හෝඩුවාවක් ගත නොහැකි විය. එබැවින් මට තරමක චකිතයක් ඇතිවිය. මෙහි ගෝනුන් සහ වල්ඌරන් හැර වෙනත් වන සතුන් නැතිබව දැන සිටි බැවින් එතරම් බියක් ඇති නොවිය.

ඉරමුදුන් වී තිබුනෙන් යායුතු දිශාව ගැන පැහැදිලි අවබෝධයක් ගත නොහැකි විය. මා ළඟ GPS උපකරණයක් තිබුනත් මූලික පහසුකම් කිසිවක් එහි නොමැති බැවින් එය පරිහරනය කිරීමට උත්සාහ කිරීම කාලය නාස්ති කිරීමක් බව මට අවබෝධ විය. ජංගම දුරකථනය සහ vhf-2m transceiver උපකරණ ළඟ තිබුනත් ඒවා භාවිත නොකළේ අන් අය කලබල වී අනිසි බියක් ඇතිකර ගන්නා නිසාය.

කන්ද උඩටම යාම අපහසුබව අවබෝධ කරගත් මා ඒ අදහස අත්හැර හැකි ඉක්මනින් වනපියසෙන් පිටවන මගක් සොයාගතයුතු බව වටහාගතිමි. හදිසියේම කළු පැහැති ගුලියක් දක්නට ලැබුනි. ඒ සර්පයෙක් බව පෙනුනෙන් වහාම ආපසු හැරුනෙමි. ගස් අතර සාමාන්‍ය පරතරය අඩියකට දෙකකට වඩා නොවූ බැවින් ඉක්මනින් යා නොහැකිය. මෙසේ ටිකදුරක් යනවිට, වියලී ගිය දිය පාරක් දක්නට ලැබුනෙන් මා ඉමහත් සතුටට පත්විය.

එම මාර්ගය අනිවාර්යයෙන්ම ජලාශයකට හෝ පහත් සරුබිමකට යායුතුමය. එබැවින් මම එම වියලි දියපාර මග නොහැරෙන අයුරුම ඉදිරියට පා නැගුවෙමි. ටික දුරක් යනවිට එහි යාන්තමින් තෙත් ගතියක් පෙනුන අතර තවත් පහළට යනවිට යන්තමින් ජලය ගලා බසින බවත් ඉතා පිරිසිදු බවත් පෙනෙන්නට තිබුනි. දෝතින් ජලය ගෙන බීමෙන් පිපාසය සහ විඩාවද සන්සිඳුවා ගතිමි. වැඩිදුරක් යාමට පෙර එළිමහන් පෙදෙසක් නෙත ගැටුනෙන් විශාල සතුටක් ඇතිවිය.

කෙසේ වෙතත් මේවනවිට පැයකට වැඩි කාලයක් මහවනය තුල අතරමංව සිට ඇත. එළිමහන් බිමෙහි තරමක් ඈතින් වගා කටයුතු සඳහා එළිපෙහෙලි කර ඇති බවත් ඈත පැල්කොටයක් ඇති බවත් පෙනෙන්නට තිබුනෙන් මම ඒ දෙසටම ගියෙමි. ටික දුරක් යනවිට නිවාස කීපයක් දක්නට ලැබුන අතර වගා කටයුතුවල නිරත ගොවිමහත්මයෙක් හමුවිය. මම ඔහුට කථාකර,
“හියාරේ ටැන්කිය පැත්තට යන්න පුළුවන් කොහෙන්ද?” යයි විමසුවෙමි. (එම ප්‍රදේශයේ වැසියන් එම ජලාශය හඳුන්වන්නේ හියාරේ-ටැන්කිය යනුවෙන් බව නදීක විසින් පවසා තිබුනි) ඔහු පුදුමයෙන් මෙන් මා දෙස බලමින් “මහත්තය කොහෙ ඉඳලද ඔය එන්නෙ?”
“මම හියාරේ ටැන්කිය පැත්තෙ ඉඳල කැලේ මැද්දෙන් ආවෙ”
“තනියෙම?”
“නෑ තව කට්ටියක් එක්ක ආවෙ, කැලේ මැද්දෙදි මගඇරුන, ප්‍රධාන පාරකට යන විධිය මට කියන්න, ඒ ඇති”
ඉන් පසු ඔහුගේ මග පෙන්වීම අනුව ගුරු පාරකට පිවිසුනෙමි. එහිදී මම vhf උපකරණයෙන් නදීකට කථා කළවිට ඔහු වාහනයකින් ඒමට සූදානම් වුවත්, එය අනවශ්‍ය බව මම කීවෙමි. එම ගුරු පාර දිගේ කිලෝමීටරයක් පමණ ගිය පසු ප්‍රධාන පාරට පිවිසුන මා තවත් කි.මී. එකහමාරක් පමණ මග ගෙවා අපගේ නිවහනට ළඟාවනවිට සවස දෙකහමාර පමණ විය. (පැය තුනහමාරක් පමණ ගතකර ඇත)




ඉහත දැක්වෙන්නේ Google Earth මගින් දැකගතහැකි චන්ද්‍රිකා ඡායාරූපයක හියාරේ වන පියසෙන් අඩක පමණ ප්‍රදේශය දැක්වෙන ආකාරයයි. එහි Hiyare යනුවෙන් සඳහන්ව ඇත්තේ අපගේ නවාතැන වූ ගාල්ල වනජීවී සංගමයේ නිල නිවාසයයි. ($6^0$ , 3' , 31" N,  $80^0$, 18' , 55" E) එම ඡායාරූපයේ A,B,C,D,E,F,G,H,I,J,K,L යනුවෙන් සඳහන් කර ඇති ස්ථාන පිළිබඳ විස්තර පහත දැක්වෙන අයුරු වේ.

A - වන පියසට ඇතුල් වූ ස්ථානය

B, C, D, E යනු අප කන්ඩායම සමග ගමන්කළ මාර්ගයයි. මා වෙන් වූයේ E හිදීය.

F- එළිමහන් ප්‍රදේශයට පිවිසුන ස්ථානය

G- ගොවි මහතා හමුවූ ස්ථානය

H, I, J, K මා ගමන් කළ ගුරු පාර

K- ප්‍රධාන පාරට පිවිසුන මං සන්ධිය

L- නවාතැනට පිවිසෙන ගුරු පාර ආරම්භවන මංසන්ධිය

ජේ.ටී.විජේරත්න - 4S7VJ

2016 දෙසැ. 13